
ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 ජූලි 02 සඳුදා
04 වෙළුම - 36 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය





## ශු. මරියා ගොරෙත්ති තුමිය

### කුඩා දරුවන්ගේ පිරිසිඳු පරමාදර්ශී ජීවිතය

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# නිශ්ශබ්දතාවය සහ දේව වචනය ධර්මදනයේ මාවතයි.

**ආදරණීය දුවේ පුතේ...**

46 වැනි ලෝක ජනමාධ්‍ය දිනය මේ වසරේ පවත්වනු ලබන්නේ ජූලි මාසයේ 08 වන ඉරුදිනයි. කතෝලික සභාවත් මෙලෙස ලෝක ජනමාධ්‍ය දිනයක් පවත්වනු ලබන්නේ ඇයි කියලා පුංචි ඔබ ප්‍රශ්න කරන්න පුළුවන්. කතෝලික සභාව ලෝක ජනමාධ්‍ය දිනයක් පවත්වනු ලබන්නේ දෙවන වතිකාන කතිකාවේදී ගනු ලැබූ තීරණයකට අනුවයි. විශේෂ යෙන්ම මෙම දෙවන වතිකාන කතිකාවේදී ඉදිරිපත් කළ මූලික ලියවිල්ලකට අනුව මුළු ලෝකය පුරාම ශුද්ධවූ කතෝලික සභාව තුළ සියලුම පදවි අතර සෑම වසරකදීම සභාවේ සන්නිවේදන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා වූ විශේෂ යාච්ඤා දිනයක් පැවැත්වීමට නියෝගයක් නිකුත් කෙරුනා.

සන්නිවේදන මාධ්‍යවල නියැලී සිටින අය තම තමන්ගෙ වගකීම් හා යුතුකම් නිවැරදිව හඳුනාගෙන සභාව තුළ සිදු කරනු ලබන සමාජමය සන්නිවේදන කටයුතු වලට සහය වෙමින් දයක වීම පිළිබඳව උනන්දුවක් එම නියෝගයත් සමඟම මුළු මහත් ශුද්ධවූ සභාව තුළ ඇති වෙන්නට පටන් ගත්තා.

ආදර දුවේ, පුතේ, කතෝලික සභාව තුළ විශේෂා කාරයෙන් උනන්දු වන ඉලක්ක අතර සියලු මාධ්‍යයන්හී අවසන් ප්‍රතිඵලයන් පිළිබඳවද පුළුල්ව කථා කරනවා. ඒ අනුව සභා ඉගැන්වීම ප්‍රකාශ කරන්නෙ සියලු මාධ්‍යයන්හි ඒකායන එල්ලය විය යුත්තේ මිනිස් වර්ගයා අතර සංහිඳියාව, සහෝදරත්වය හා ඒකාග්‍රතාවය ඇති කරලීම බවයි.

මේ නිසා මුළු මහත් ලෝකය පුරාම විහිදී ඇති ක්‍රියාකාරී සමාජ සන්නිවේදන ජාලයන් නිරීක්ෂණය කරමින් ශු. සභා මාතාව මිනිස් ජීවිත වල ඇති වටිනාකම් පිළිබඳව නිරන්තරයෙන්ම කථා කරනු ලබනවා. එලෙස බාහිරව ක්‍රියාත්මක වන ක්‍රියාදමයන්හි ප්‍රතිඵල බුක්ති විඳින ජනතාවගේ වර්ධනයේ ප්‍රතිඵල මහත් සේ අත් විඳින්නට නම් එම ජීවිත වල අධ්‍යාත්මික හර පද්ධතිය පිළිබඳව වඩා වැඩි උනන්දුවක් යොමු කළ යුතු බවයි, සමස්ථ සභාවේම පරමාර්ථය වන්නෙ.

ආදර දුවේ, පුතේ,

මෙවර ලෝක ජනමාධ්‍ය දිනය මුල් කොට ගෙන ඉතාමත් හරවත් පණිවුඩයක් අති උත්තම xvi වැනි බෙනඩික් ශුද්ධෝත්තම පියාණන් නිකුත් කොට තිබෙනවා. එහි සමස්ත හරය තමයි මෙවර මෙම ලිපියටත් තේමාව වී තිබෙන්නේ ''නිශ්ශබ්දතාවය සහ වචනය ධර්මදනයේ මාවතයි.'' එතුමාණන් පවසන්නේ සන්නිවේදනය පිළිබඳව වඩාත් ගැඹුරින් සිත යොමු කරන විට දේව ධාර්මික පරිසරය තුළදී නිශ්ශබ්දතාවය සහ වචනය අතර පවතින්නේ ඉතාමත් සමීප සම්බන්ධතාවයක් බවයි. මෙවර ලෝක ජන මාධ්‍ය දිනය අළලා ශු. සභාව තුළ දියත් වෙන මෙම පණිවුඩය පොදුවේ කා හටත් අලුත් අරුතක් සන්නිවේදනයට ගෙන එන්නට හොඳ පසුබිමක් ලබා දේවි.

සුදෙතුම් පියතුමන්ට අනුව සන්නිවේදන ක්‍රියාවලියේදී එකිනෙකා දක්වන සත්‍යවාදී වූ, අව්‍යාජ ආදරය, සෙනෙහස , දුක, සොම්නස, ත්‍රාසය හා භීතිය වැනි හැඟීම් හා ඉරියව් ප්‍රකාශ වන්නේ නිශ්ශබ්දතාවය මගිනි. එහිදි සිදුවන දෑ මෙලෙස විස්තර වෙනවා.

''අප රකින නිහඬතාවය මගින් සිදුවන මූලික ක්‍රියා දමයක් වන්නේ අපේම වචන හා අදහස් වලට පමණක් සීමා නොවී අන් අයගේ හැඟීම් ප්‍රකාශ කිරීමට මනා අවස්ථාවක් ලබා දීමයි. මෙහිදි අපි එකිනෙකාට ඇහුම්කන් දීමට ඇති ඉඩ කඩ පුළුල් වෙනවා පමණක් නොව එමගින් වඩාත් ගැඹුරු මානුෂික සම්බන්ධතාවයක් ගොඩ නැඟීම සඳහා වටපිටාවද අවශ්‍යයෙන්ම සැකසෙනවා.''

මේ උදර පණිවුඩය පිළිබඳව මෙවර ඔබ අනිවාර්යයෙන්ම හිත යොමු කළ යුතුයි. ඔබේ දහම් පාසල් ගුරුවරුන්ගෙන් මෙම ලෝක ජන මාධ්‍ය දිනය පිළිබඳව වැඩි විස්තර දැනගත යුතුයි. සුදෙතුම් පියතුමන්ගේ පණිවුඩය ගැන හොඳ අධ්‍යයනයක් කළ යුතුයි. ඒ මගින් මේ උතුම් මෙවලමේ සැබෑ අධ්‍යාත්මික පංගුකාරයන් වන්නට ඔබ අවධානය යොමු කළ යුතු බව අවධාරණයෙන්ම පවසන්න කැමතියි.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක
**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**

# ආසියානු කුසලාන ක්‍රිකට් තරගාවලියේ ශ්‍රී ලංකා අවුරුදු 19 න් පහල ක්‍රිකට් පිලේ නායකත්වය මොරටුව සා. සෙබස්තියන් විදුහල් ක්‍රීඩකයකුට..........

- මොරටුව සා. සෙබස්තියන් විදුහලින් ක්‍රීඩකයන් තිදෙනෙක්.
- උප නායක ඇතුළු කිතුනු පාසල් ක්‍රීඩකයන් රැසක්ම කණ්ඩායමේ......

පසුගියදා මැලේසියාවේදී ආරම්භ වූ වයස අවුරුදු 19 පහල ආසියානු කුසලාන එක්දින ක්‍රිකට් තරගාවලියේ ශ්‍රි ලංකා ක්‍රිකට් පිල නියෝජනය කිරීමට කතෝලික පාසල් ක්‍රීඩකයන් රැසක්ම එක්ව සිටිම විශේෂත්වයකි.

පසුගියදා නිමාව දුටු ශ්‍රී ලංකා පකිස්තාන් එක්දින තරගාවලියේ තීරණාත්මක අවසන් තරගයේ දී තම පිලට ජය ගෙනෙමින් විශිෂ්ට පිති හරඹයක් දියත් කරමින් තරගයේ වීරයා වූ ශ්‍රී ලංකා පිලේ උප නායක ඇන්ජලෝ මැතිව්ස් හා තුන් ඉරියව් දස්කම් පාමින් තරගාවලියේ වීරයා බවට පත්වූ තිසර පෙරේරා ද කිතුනු පාසල් ක්‍රිකට් ක්‍රීඩකයන්ය.

මෙවර ශ්‍රී ලංකා වයස අවුරුදු 19 න් පහල ක්‍රිකට් කණ්ඩායමේ නායකත්වය දරනුයේ මොරටුව සා. සෙබස්තියන් විදුහලේ සනිත ද මෙල් වන අතර එමෙන්ම උපනායකත්වය දරනුයේ මීගමුව මාරිස්ටෙලා විදුහලේ ඇන්ජලෝ ජයසිංහ යන ක්‍රීඩකයන්ය.

මෙවර කණ්ඩායමට මොරටුව සා. සෙබස්තියන් විදුහලින් ක්‍රීඩකයන් තිදෙනෙකු ඇතුළත් වීම කැපී පෙනෙන්නකි. අනෙක් ක්‍රීඩකයන් වනුයේ අමිල අපොන්සු හා අනුක් ප්‍රනාන්දු ය.



කණ්ඩායම් නායක
**සනිත ද මෙල්**

මෙම කණ්ඩායම නියෝජනය කිරීමට බම්බලපිටියේ ශා. පීතර විදුහලේ ෂෙහාන් ප්‍රනාන්දු හා රනිත ලියනාරච්චි, කොටහේන ශා. බෙනඩික් විදුහලේ ජේසන් පෙරේරා හා වෙන්නප්පුව සා. ජෝශප් වාස් විදුහලේ කසුන් විදුර අධිකාරි වරම් ලබා ඇත.

තරගාවලිය කාණ්ඩ දෙකක් යටතේ රටවල් 8 ක් නියෝජනය කරනු ලබන අතර ශ්‍රී ලංකා පිල ''බී'' කාණ්ඩයෙන් තරග වදී. කණ්ඩායමේ නායක සනිත ඇතුලු කිතුනු පාසල් ක්‍රීඩකයන්ට කැපී පෙනෙන දස්කම් පෑමට ළමා ප්‍රදීපයේ සුබ පැතුම් !

**කුමර නයනජිත්**

## ස්නේහයේ රැජිණියනි .......

සඳ මඩලේ වසන්න කිනරාව ඔබයි
නිල් අහසේ සුපිපෙන්නට ......
නෙත් දහසක් අභියස
ඔබේ නෙත් යුග දැල්වේවා
අන් හැම නෙත් පියවුවත් ....
මගේ අම්මේ.......
දාරක ස්නේහයේ
ලයාන්විත සප්ත ස්වරයෙන්
ඔබේ හඬ ශබ්ද මාධූර්යය
නිවයි මගේ හදේ සෝ සුසුම් ....
කන්කලුයි , මිහිරියි
ඔබේ අදරැති වදන්
අනෝරාවේ උණුසුමක් ලෙස
දරා ගන්නට ඔබේ ප්‍රේමය
නොබිඳෙන කැඩපතකි



ශානුක මධුරංග ඔබ්‍රිස්
12 - ශ්‍රේණිය (කලා)
ශා. ඇන්ඩෘ මධ්‍යමහ විද්‍යාලය - පුත්තලම

# මාරවිල ශා. පාවුළු දෙව්සත්හල් සිසුන්ට ලේඛක වැඩමුළුවක්

හලාවත පදවියට අයත් මාරවිල ශා. පාවුළු දෙව්සත්හලේ ඉගෙනුම ලබන සිසුන් සඳහා ලේඛක වැඩමුළුවක් පසුගියදා දෙව්සත්හලේදී පැවැත්වුණි. මෙදින ජන සන්නිවේදනය, පුවත්පත්කලාව හා ලේඛන කලාව පිළිබඳව සිසුහු දැනුවත් කළහ. මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. මෙහිදි සිසුන්ට ලේඛක අභ්‍යාසයක්ද ලබා දුන් අතර සාර්ථක නිර්මාණයන් ළමා ප්‍රදීපයෙහි පළ කිරීමට අවස්ථාව ලබා දීම ආධුනික ලේඛක සැමට විශාල දිරියක් මෙන්ම විශේෂ අවස්ථාවකි. මේ සඳහා විශාල උනන්දුවක් සිසුන් තුළ පැවති අතර දේශක මහතා ඉතා සරලව සුහදශිලිව ආකර්ශණීයව වැඩමුළුව මෙහෙයවීම ප්‍රශංසනීය වන අතර මෙහි සාර්ථකත්වයට එය මහත් රුකුලක් විය. මාරවිල සාන්ත පාවුළු දෙව්සත්හලේ අදියුරු හා උප අදියුරු ගරු ජයන්ත පෙරේරා , රනිල් සඳරුවන් යන පියතුමන්ලා එක්ව මෙය සංවිධානය කරන ලදි.





**දිනේෂ් මධුෂංක - ඩිෂාන් මධුවන්ත.**
**සා. පාවුළු දෙව්සත්හල - මාරවිල**

හලාවත පදවිය



බෝලවත්ත මීසමේ ළමුන් 84 දෙනෙකු පසුගියදා සුදතුම් වරම් ලැබීය. දේව මෙහෙය මහනුවර පදවි රදගුරු අති උතුම් ජෝශප් වියානි ප්‍රනාන්දු සහ හලාවත පදවි රදගුරු අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් යන රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිනි.

දිව්‍ය පූජාවෙන් පසු සුදතුම් වරම් ලැබු ළමෝ හලාවත රදගුරු හිමිපාණන් සහ බෝලවත්ත හිටපු මීසම් සේවක ගරු ඇන්ටනි රංජිත් ප්‍රනාන්දු සහයක ගරු සුජාන් නිශ්ශංක යන පියතුමන් සමඟ ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටියහ.

**(හෂිනි මලීෂා - ජාකොමේ ගොන්සාල්වෙස් දහම් පාසල - බෝලවත්ත.)**

## සුදතුම් වරම් ලැබීම





නිට්ටඹුව මීසමට අයත් දේවස්ථාන 04 ක ළමෝ 36 දෙනෙකු පසුගියද ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. දිව බොදුන් ලැබූ ළමුන් මීසම් සේවක ගරු ප්‍රැන්සිස් ජයකොඩි මීසම් සහයක ගරු අසිත නිරංජන් ප්‍රනාන්දු පියතුමන් හා ආචාරිණී නිලූකා එදිරිසිංහ මහත්මිය ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු.

**ඡායාරූපය :- සම්පත් ඩයස්**
**සටහන :- ඇන්ටනි මොරගොඩ**
**නිට්ටඹුව**

## කොළඹ අගරදගුරු පදවිය




**ඔබේ දහම් පාසල ගැන අපිට ලියලා එවන්න ...**

ඔබේ දහම් පාසල පිළිබඳව තොරතුරු, දහම් පාසලේ ළමුන්, ආචාර්ය මණ්ඩලය හා සිසු නායකයින්ගේද සේයාරූ සමග අප වෙත යොමු කරන්න.
අපේ දහම් පාසල, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

## අනුරාධපුර පදවිය



මැදවච්චිය මීසමේ දරු දැරියන් පස් දෙනෙක් පසුගියද පළමු වරට දිව්‍ය සත්ප්‍රසාදිය ජේසුව ලබා ගන්නා ලදි. ඉන් අනතුරුව මීසම් සේවක සරත් පෙරේරා (නි.ම.නි.) පියතුමන් සහ ඔවුන්ට ඉගැන්වූ පැවදි සොයුරියන් සමඟ ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු.

## හලාවත පදවිය



නාත්තන්ඩිය තුම්මෝදර මීසමේ ළමෝ 07 දෙනකු ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. ඔවුන් මීසම් සේවක ගරු ෆ්‍රැන්සිස් පුල්ලේ පියතුමා හා රේණුකා ප්‍රියන්ති දහම් ගුරුවරිය සමග ළමා ප්‍රදීපය සඳහා සමූහ ඡායාරූපයකට පෙනීසිටි අයුරු මෙහි දිස්වේ.

**ශ්‍රියාංගණී ෆිලීෂියා - නාත්තන්ඩිය**

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## සුවදානයේ ප්‍රසාද නිධාන

★ **නව ධර්මෝපදේශය පෙන්වා දෙන පරිදි ශුද්ධවූ අගුස්තීනුතුමා පාපොච්චාරණය වෙනුවට භාවිත කළ නම කුමක්ද?** ● පාපය විනාශ කිරීම

★ **මුල් අගුණ පාප හත නම් කරන්න.**
බොහෝ අනෙක් පාපයන්ට මුල්වන පාප, මුල් අගුණ පාප නම් වේ.
● උඩගුව ● තණ්හාව ● රාගය ● ක්‍රෝධය ● කෑදරය ● ඊර්ෂ්‍යාව ● අලසකම

★ **පූර්ණ පසුතැවීම යනු කුමක් ද?**

● පූර්ණ පසුතැවීම යනු දෙවියන් වහන්සේ වෙත ඇති ආදරය තුළින් අප තුළ සිදුවන පසුතැවීමයි.

## පාපොච්චාරණය පිළිබඳ බයිබලීය දැක්ම

★ **පව් සමාව පිළිබඳ ජේසුස් වහන්සේ ශ්‍රාවකයින්ට ප්‍රකාශ කළේ කුමක් ද?.**

● ''ශුද්ධාත්මයාණන් පිළිගන්න. ඔබ යමකුගේ පව් කමා කරන්නාහු ද ඒවා ඔවුන්ටත් කමා කරනු ලැබේ. ඔබ යමකුගේ පව් කමා නොකරන්නාහුද, ඒවා කමා නොකරනු ලැබේ.'' (ජොහාන් 20/22,23)

● ''ඔබ මිනිසුන්ට ඔවුන්ගේ වරද කමා කරන්නාහු නම්, ඔබේ ස්වර්ගීය පියාණන් වහන්සේ ඔබටත් කමා කරන සේක. එහෙත් ඔබ මිනිසුන්ට ඔවුන්ගේ වරදට කමා නොකරන්නාහු නම්, පියාණන් වහන්සේ ඔබේ වරදටත් කමා නොකරන සේක.'' (මතෙව් 6/14,15)

★ **මනුෂ්‍ය පුත්‍රයාණන්ට පව් කමාකිරීමේ බලය ඇති බව පෙන්වීමට ජේසුස් වහන්සේ කළ ප්‍රාතිහාර්ය තුනක් නම් කරන්න.**

● අංශභාග රෝගියා සුව කිරීමේ සිද්ධිය.
''පොළවෙහිදී පව් කමා කිරීමේ බලය මනුෂ්‍ය පුත්‍රයාණන්ට තිබෙන බව ඔබට පෙන්වා දෙමී'' (මතෙව් 9/6)

● පව්වුටු අඟනකට කමාව
'' ඇගේ බොහෝ වූ පව් ඇයට කමා කරන ලද බව ඈ මට දැක්වූ ඉමහත් ප්‍රේමයෙන් ඔප්පු වේ. ඔබේ පව් ඔබට කමා කරන ලදි.'' (ලූක් 7/47,48 )

● කුදු ස්ත්‍රිය සබත් දින සුව කිරීම
''ස්ත්‍රිය ඔබේ දූර්වල කමින් ඔබ මිදුණෙහිය '' (ලූක් 13/12)

**ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.**

★ **ශුද්ධාත්මයාණන් වහන්සේට විරුද්ධ පව් 06 නම් කරන්න.**

● තම ගැළවීම ගැන බලාපොරොත්තු කඩ කර ගැනීම
● පාප ක්ෂමාව ද යහපත් ක්‍රියාවන්හි පින් හේතු ද නොමැතිව ගැළවීම බලාපොරොත්තු වීම.
● ආගමික සත්‍යතා ප්‍රතික්ෂේප කිරීම
● අනුන් ලබන දේව වරප්‍රසාද ගැන ඊර්ෂ්‍යා කිරීම
● පාපයෙහි ඇලී ගැලී සිටීම
● පසුතැවිලි නොවී ජීවිතක්ෂයට පත්වීම

# ශු. මරියා ගොරෙට්ටි මුනිවරිය



ජූලි මස 06 වන දින මංගල්‍යය සමරන ශු. මරියාගොරෙට්ටි මුනිවරිය ළමා ශුද්ධවන්තියන් අතර ප්‍රබල ශුද්ධවන්තියක් යැයි පැවසුව හොත් එය නිවැරදිය. ක්‍රි.ව. 1890 ඔක්තෝබර් 16 වන දින , ඉතාලියේ , මාර්චේ ප්‍රාන්තයේ ඇන්කෝනා නගරයේ කොරින්ෆැල්ඩෝ ග්‍රාමයේ දී මෙතුමිය උපත ලැබුවාය. දිළිඳු ගොවි පවුලකට ආව මෙලොව ජනිත වු මෙතුමියගේ පියා ලුවිස් ගොරෙත්ති වු අතර මව අසුන්තා කාලිනී විය. මරියා පවුලේ තුන් වන දියණිය වු අතර ඇයට සහෝදරියන් දෙදෙනෙකු හා සහෝදර යන් තිදෙනෙකු ද විය. කුඩා කල සිට ඇයට ගොවි පවුලකට ආව උපත ලැබු නිසා ම ඉතා දුෂ්කර අත්දැකීම් වලට හා වේදනාත්මක සිදුවීම්වලට මුහුණ පාන්නට සිදුවිය. එනමුදු තම මවගේ හා පියාගේ ආදරය ලබමින් වැඩුණු මරියා ඉතා ප්‍රිය ජනක රූමත් දැරියක වුවාය. ඇයට එම වයසේ අනෙකුත් දරුවන් ලබන සැප සම්පත් නොමැති වුවත් කිසි දිනෙක ඒ ගැන කනස්සලු නොවුවාය. ඇය තම සහෝදරයන් සමග සතුටින් ජීවත් වෙමින් මවට හා පියාට ඉතා කීකරුව සිටියාය. ඇයට වයස අවුරුදු හයක් පමණ වන විට දේවමාතාවන් කෙරේ භක්ත්‍යාදරයක් දැක්වුවාය. එපමණක් නොව යාච්ඤාවට වැඩි වේලාවක් යොමු කළ ද, ඇගේ අසල්වැසි මිතුරන් සමග ක්‍රීඩා කිරීමට , තණ බිම් , මිටියාවත් , වල ද දුව පැන ඇවිදිමින් කෙළිදෙළෙන් ගත කිරීමට ඇය යොමුවී සිටියාය. මරියාගේ වයස අවුරුදු 8 ක් පමණ වන විට ගොරෙත්ති පවුලට ඉතා ප්‍රබල ආහාර හිඟයකට මුහුණ පාන්නට සිදුවිය. මේ නිසාම පේරිය නැමැති ප්‍රදේශයට පදිංචියට යාමට සිදුවිය. එහි ජීවත්වීම පෙරට වඩා දුෂ්කර කාර්යයක් විය. එම ප්‍රදේශය සෙසු ප්‍රදේශවලට වඩා දේශගුණික තත්ත්වයක් පැවති අතර, ඒ ප්‍රදේශය වගුරු බිමක් විය. මේ නිසාම නිතර නිතර රෝගී තත්ත්වයන්ට පත්වූ අතර , මේ කාලයේ දී මරියාගේ පියා හා ඔහුගේ මිතුරකු වු සිග්නෝ සිරනේලිසි සහ ඔහුගේ දහසය හැවිරිදි පුත් ඇලෙක්සැන්ඩ්‍රෝ ද කුලී ගොවින් ලෙස සේ- වය කළහ. නොසිතු පරිදි ඒ ප්‍රදේශයේ පැතිරී ගිය දරුණු වසංගත රෝගයකට ලක්ව , මරියාගේ පියා මියගිය අතර, ඒ සිදුවීමෙන් ඇගේ පවුලේ අයට තිබු ස්ථානයෙන් තවත් ප්‍රපාතයකට ලක්විය. ඇගේ මව දරුවන් සය දෙනාගෙ'ම වැඩ කටයුතු දිරිමත්ව භාර ගෙන , පියාගේ මරණයෙන් පසු මවට රැකියාවට යාමට සිදු වීමෙන් ගේ දොර ඉවුම් පිහුම් කටයුතු හා කුඩා සහෝදර , සහෝදරයන් බලා ගැනීමේ වගකීම ද මරියා පිට වැටිණි. ඒ සියලු කාර්යයන් ඉතා සාර්ථකව නොපිරිහෙලා ඇය විසින් ඉටුකළ අතර, යාච්ඤාව හා ජපමාලය තුළ සන්නද්ධ වෙමින් ඒ සියලු කාර්යයන් සාර්ථකව ඉටුකරන ලදී. වයස අවු. 11 දී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබු ඇය එදින තම දිවියේ ස්වර්ණමය අත්දැකීම බවට පත්කරගත්තාය. දිව්‍ය සත්ප්‍රසාදීය ස්වාමීන් වහන්සේ ඇගේ හද තුළට පිළිගැනීමට මරියා ඉතා උද්යෝගිමත් වු අතර, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබු දින ඇගේ නිවසේ සිටි සියල්ලන් වෙත ගොස් තමාගෙන් වරදක් වුවානම් සමාව අයැද සිටින බවද ඉතා බැහැපත්ව කියා සිටියාය. මේ කාලය වන විට ඔවුන්ගේ නිවසේ පදිංචි වී සිටි ඇලෙක්සැන්ඩ්‍රෝ මරියාගේ රූපයට උමතුවී ඇයව දෙවතාවක් ම වරදට පොළඹවා ගැනීමට උත්සහ දැරු නමුත් ඒවා අසාර්ථක විය. ඒ නිසා ඔහු ඇයට වෛර කළේය. ක්‍රි.ව. 1902 ජූලි 05 වන දින ඇගේ නිවසේ කිසිවකු නොසිටි අවස්ථා වේදී ඈ කෙරේ අපිරිසිදු චේතනාවෙන් විසු ඇලෙක් සැන්ඩ්‍රෝ මරියා හට තියුණු පිහියකින් ඇන්නේය. ඇගේ ශරීරයේ දසසතර පලකට මෙලෙස වෛරයෙන් පසු වු ඇලෙක්සැන්ඩ්‍රෝ පිහියෙන් අනින ලදුව ඇගේ කෑ ගැසීමේ හඬ ශබ්දය අසා ඇගේ මව දිව ආ අතර, ඇය, ක්ලාන්තවුයෙන් වහාම ඇයව රෝහල වෙත ගෙන යන ලදී, මරණා සන්නව සිටි ඇය ඇලෙක් සැන්ඩර් වෙත සමාව දෙමින් තම මවට මෙලෙස පැවසුවාය. ‘‘අම්මේ මම පළමුවරට, දිව්‍ය සත්ප්‍රසාද ලැබු දවසේ ජේසුට පොරොන්දු වුනා මං මැරුනත් මගේ දේව ජීවිතය නැති කර ගන්නේ නැහැ කියලා. මම ඒ පොරොන්දුව ඉටු කළා. ඒ ගැන මට සතුටුයි, මම ඔහුට මගේ මුළු හදවතින්ම සමාව දෙනවා. මට සතුටුයි. ඔහුත් දවසක මාත් සමග සුරලොව සිටිනවා දකින්න මම හිතනවා. දෙවියන් වහන්සේ ඔහුට සමාව දෙයි කියලා. ....’’යැයි පැවසු ඇය ක්‍රි.ව. 1902 ජූලි 06 වන දින ස්වර්ගස්ථ වුවාය. ක්‍රි.ව. 1947 වර්ෂයේ දී xii වන පියුස් සුදු පියා ඇයව භාග්‍යවරයට ඔසවන ලද අතර, 1950 දී ශුද්ධවරයට ඔසවන ලදි. එම දිව්‍ය යාගයට ඇගේ මවවු අසුන්තා ද ඇයව මරණයට පත්කොට පසුව සිය දිවිය පෙරළියකට පත්කර ගත් ඇලෙක්සැන්ඩ්‍රෝ ද සහභාගි විය. ඇගේ මංගල්‍යය ජූලි 06 වන දින සමරනු ලබයි.

**අසේල දසනායක**

**කතෝලික ජනවන්දනා පිළිවෙත් ලොව කවර රටකදී වුවද වෙනස් නොවේ. කතෝලික සභාවේ විශ්වීය ගුණාංගය ප්‍රකට කරන්නටද එය ද හේතු වී ඇති බව නොරහසකි. කතෝලිකයාගේ ප්‍රබල අනන්‍යතා සලකුණ කුරුසියයි. කුරුසිය පැළඳීම , කුරුසියට ගරු කිරීම, ශ්‍රී කුරුසිය උදෙසා මංගලෝත්සව පැවැත්වීමෙන් නතර නොවන කතෝලිකයා සිය දෛනික ජීවිතයේ බොහෝ අවස්ථාවල සිය නළලත කුරුසියේ සළකුණ ඇඳ ගනී.**

**කුරුසියේ සලකුණ හුදු භක්තියේ සංකේතයක් පමණක් නොවේ.
එය ඉතා බලගතු යාච්ඤාවකි.**

සමස්ත කතෝලික ලෝකය පුරාම කතෝලික අනන්‍යතාවයක් ලෙස පිතා පුත්‍රයා සලකුණු කිරීම සැලකේ. ඇතැම් විට චිත්‍රපට හෝ ටෙලිනාට්‍ය වලදී පවා චරිතයන්හි කිතුනු බව සංකේතවත් කරන්නට මේ සලකුණ යොදා ගැනේ. පිතා පුත්‍රයා සලකුණෙන් තුන්දෙනා වහන්සේගේ ආරක්ෂාව හා රැකවරණය සහතික කැරේ. කතෝලික බවේ මේ විශ්වීය සංකේතයට පෙර ශ්‍රී ලංකාවේ සිංහල හා දමිළ කතෝලිකයන්ට සුවිශේෂවූ සාන්ත කුරුසියේ සලකුණ භාග්‍යවත් ජුසේවාස් පිය සමයේ පූජ්‍ය ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමන් වෙතින් මෙරට කතෝලිකයන්ට ලැබුණු සුවිශේෂී උරුමයක් ලෙස සැලකිය හැකිය. **සාන්ත කුරුසේ අඩයාලමේ අපේ සතුරන් ගෙන් අප ගලවා දෙවා, අපගේ දෙවි ස්වාමිනි, පිතාගෙත්, පුත්‍රයාගෙත්, ස්ප්‍රිතු සාන්තුගෙත් නාමයෙන් ආමෙන්.** යන්නෙ මුල් කොටසින් සංකේතවත් කරන කුරුසියේ සුවිශේෂී බලය සිරිලක කතෝලික පරපුරට නිරන්තරයෙන් අත්විඳින්නට යැදුමක් සමගින් පිළිවෙතක් අපට උරුම වී ඇත.

කුරුසියේ සලකුණේ වටිනාකම, එහි බලය මෙන්ම වරප්‍රසාද ගැනද මදක් විමසා බලමු. කතෝලිකයන් ලෙස කුරුසියේ ලකුණ සලකුණු කිරීමට හේතු වන කාරණා හයක් පෙන්නා දිය හැකිය.

කතෝලිකයන්ගේ සෑම යැදුමක්ම ඇරැඹෙන්නෙත් අවසන් වන්නේත් කුරුසියේ සලකුණෙනි. මෙහි බලය හා එහි වරප්‍රසාදිත වටිනාකම පිළිබඳව ගැඹුරින් අවබෝධ කරගන්නේ නම් අප හැම විටම එය අර්ථ පූර්ණව මහත් භක්තියෙන් හා විශ්වාසයෙන් යුතුව උච්චාරණය කරමින් සලකුණු කිරීමට මැලි නොවනු ඇත.

කුරුසියේ සලකුණ හුදු භක්තියේ සංකේතයක් පමණක් නොවේ. එය ඉතා බලගතු යාච්ඤාවකි. ඒ නිසාම ශුද්ධවූ සභා මාතාව සෑම ආසිරි ගැන්වීමකදීමත්, සක්‍රමේන්තු දානය කිරීම වැනි අති වැදගත් අවස්ථාවකත් කුරුසියේ සලකුණ යොදන්නට පියවර ගෙන ඇත.

කුරුසියේ ලකුණ සතු මේ අසමසම බලය ගැන ශුද්ධ ලියවිලිලත්, සභා පියවරුන් හා සාන්තුවරුන්ද සභා ඉගැන්වීම් මගින් ද සනාථ කර ඇත. කුරුසියේ සලකුණේ පවතින සුවිශේෂී වටිනාකම් හයක් අපට හඳුන්වා දිය හැක.



# ලංකාවට සු
# සාන්ත කුරුසි

## 01 කුරුසියේ සල
## පළකිරීමේ සං

කුරුසියේ සලකුණ
විසින් තමන් වහන්සේ අ
බව පිළිගෙන උන්වහන්
ඒකායන විශ්වාසය ප්‍රකා
අපෝස්තුළුවරුන්ගේ විශ
සංක්ෂිප්ත ලෙස හෙවත්

අපගේ නළලත,
තොල් , පපුව සහ දෙවු
මත අත් තබමින් සලකුණු
කරමින් අපගේ පියාණන්
වහන්සේ, පුත්‍රයාණන්
වහන්සේ, මෙන්ම ස්ප්‍රීතු
තුන්දෙනා වහන්සේ වෙත



# විශේෂි වු
# යේ සලකුණ

## ණු විශ්වාසය
## ක්තයකි.

දෙවියන් වහන්සේ
නාවරණය කරනු ලැබූ
සේ කෙරේ අපගේ
ශ කිරීමකි. එමෙන්ම
ශ්වාස ලක්‍ෂණය
ලුහුඬින් ප්‍රකාශ කිරීමකි.

ර
නු

සාන්තු වහන්සේ යන
අපේ විශ්වාසය ප්‍රකාශ

කරමු. මෙහිදී අප අපගේ විශ්වාසය ප්‍රකාශ කරන්නේ දෙවියන් වහන්සේ සිය මැවිල්ල තුළින් ඉටුකළ සෑම සියලු දෙයත් මිනිසියාව පාපයෙන් සහ සදාකාලික මරණයෙන් ගලවා ගැනීම ගැනත් ශුද්ධවූ සභාව පිහිටුවාලීමෙන් අප සැමට ලබා දුන් නව ජීවිතය ද ගැනත්ය. මෙහිදි අප එකිනෙකා කුරුසියේ සලකුණ සංකේතවත් කර ගනිද්දී අප එකිනෙකා දෙවියන්වහන්සේගේ සහභාගිත්වය තුළ අපගේ ජීවිත තුළින් උන්වහන්සේගේ ක්‍රියාකාරකම් වලට අනාවරණය වන්නාහ.

එමෙන්ම අපගේ ජීවිත ආධ්‍යාත්මිකත්වයට පෙරලීමේ නැඹුරුතාව වැඩි වැඩියෙන් එමගින් නිහඬව ලබා දෙන්නේය.

**අපගේ නළලත, තොල් , පපුව සහ දෙවුර මත අත් තබමින් සලකුණු කරමින් අපගේ පියාණන් වහන්සේ, පුත්‍රයාණන් වහන්සේ, මෙන්ම ස්ප්‍රීතු සාන්තු වහන්සේ යන තුන්දෙනා වහන්සේ වෙත අපේ විශ්වාසය ප්‍රකාශ කරමු.**

## 2. කුරුසියේ සලකුණ ප්‍රසාද ස්නාපනය අලුත් කිරීමක්.

පළමු ශතවර්ෂයේ විසු කතෝලිකයෝ කුරුසියේ සලකුණ ස්වකීය ප්‍රසාද ස්නාපනයේදී කුමක් සිදුවුයේද යන්න සිහිගන්වමින් එය යළි

**පිතා පුත්‍රයා සලකුණේන් තුන්දෙනා වහන්සේගේ ආරක්‍ෂාව හා රැකවරණය සහතික කැරේ**

යළිත් අලුත් කරවයි. මෙය අදටත් ඒ අන්දමින් අප වෙනුවෙන් ක්‍රියාත්මක වෙමින් පවතී. අප කුරුසියේ ලකුණ සලකුණු කරන්නා හැම ප්‍රසාද ස්නාපනයේදී ක්‍රිස්තුන් වහන්සේ සමග සක්‍රමේන්තු ගත ලෙස කුරුසියේ මියයන අතර එතුමන් සමග නව ජීවිතයකට උත්ථාන කරනු ලබයි.




''එබැවින් අපේ බව්තීස්ම ස්නාපනයෙන් අපිත් උන්වහන්සේගේ මරණයට සම්බන්ධ වී උන්වහන්සේ සමග වළලනු ලැබුවෙමු. එසේ කරනු ලැබුවේ පියාණන් වහන්සේගේ මහිමාන්විත ක්‍රියාවෙන් ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන ලැබූ සේම , අපද නව ජීවිත මඟක ගමන් කරනු සඳහාය. (රෝම 6:4-6)

''මම ක්‍රිස්තුන් වහන්සේ සමඟ කුරුසියෙහි ඇණ ගසනු ලැබ සිටිමි. ඉතින් දැන් ජීවත් වන්නේ මා නොවේ ක්‍රිස්තුන් වහන්සේ මා තුළ ජීවත් වන සේක. තවද මා දැන් මාංශයෙහි ජීවත්වන ජීවිතය මට ප්‍රේම කළ , මා උදෙසා දිවි දුන් දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත්වෙමි. (ගලාති 2:20)

අප දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටිනුයේ ප්‍රසාද ස්නාපනීය වරප්‍රසාදයන් තුළ අප අලුත් කරන ලෙසය. ප්‍රසාද ස්නාපනය අප සියලු දෙනා ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය එකමුතු කරන අතර දෙවියන් වහන්සේ සමග අපගේ කාර්යයන් සවි ගන්වමින් සියලු ජනතාව පාපයෙන් සහ මරණයෙන් මුදා ගැනීමට උන්වහන්සේ තුළ වූ කැපවීම හා වෙහෙස මහන්සිය සිහිගන්වයි.

ඉතිරි කොටස ලබන සතියේ

**ශිරාන් මෛත්‍රි**

# ඉංග්‍රීසි පාඩම
## විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

**ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.** **පාඩම් අංක : 59**

# So and Such

මෙහෙම කොච්චර, කොතරම්... කියන අදහස ඉංග්‍රීසියෙන් ප්‍රකාශ කිරීමට such යොදාගත හැකියි. ඒ මෙහෙමයි.

It was **such a good book** that I couldn't put it down.
(ඉට් වොස් සච් අ ගුඩ් බුක් අයි කුඩ්න්ට් පුට් ඉට් ඩවුන්)

ඒක කොච්චර හොඳ පොතක්ද කියවනවනම් මට ඒක බිම තියන්න හිතුනෙ නෑ.

It was **such lovely weather** that we spent the whole day on the beach.
(ඉට් වොස් සච් ලව්ලි වෙද (ර්) ඇට් වී ස්පෙන්ට් ද හොල් ඩේ ඔන් ද බීච්)

දේශගුණය කොයිතරම් සුවයක්ද කියනව නම් අපි මුළු දවසම මුහුදු වෙරළෙ ගත කළේ.

It was **such a tiring journey** that I slept for one full day.

ඉට් වොස් සච් අ ටයරින් ජ(ර්)නි ඇට් අයි ස්ලීප්ට් ෆො(ර්) ෆුල් ඩේ.

ඒක කොච්චර වෙහෙස ගෙන දෙන ගමනක් ද කීවොත් මම මුළු දවසක්ම නිදාගත්තා.

සමහර අවස්ථා වලදී that නැතුවත් මෙම වාක්‍ය ප්‍රකාශ කළ හැකියි.

It was **such a nice book**, I couldn't put it down.

⋆ "මේ වාගේ", "මේ විදිහෙ" කියන අදහස ප්‍රකාශ කිරීමටත් such යොදාගත හැකියි.

His house was very untidy.
I have never seen **such a mess.**

ඔහුගේ කාමරය හරිම අපිලිවෙලයි.
ඒ වගේ අවුල්ජාලාවක් මම දැකලම නෑ.
mess (=)අවුල් සහගත තත්වයක්, හැඩිවූ තැනක්.

The priests sermon was really good.
I have never heard **such a nice sermon**.

(ද ප්‍රීස්ට්ස් ස(ර්)මන් වොස් රියලි ගුඩ්.
අයි හැව් නෙව(ර්) හ(ර්)ඩ් සච් අ නයිස් සර්මන්.

පියතුමාගේ දේශණය ඇත්තෙන්ම හොඳයි.
මම ඒ වගේ ලස්සන දේශනයක් අහලම නෑ.

I didn't know that it was **such an old house.**
(අයි ඩිඩ්න්ට් නෝ ඇට් ඉට් වොස් සච් ඇන් ඔල්ඩ් හවුස්)

මම දැන හිටියෙ නෑ ඒක ඒ වගේ පරන ගෙයක් කියලා.

I didn't expect **such a situation.**
(අයි ඩිඩ්න්ට් එක්ස් පෙක්ට් සච් අ සිටුවේෂන්)

මම ඒ වගේ තත්ත්වයක් බලාපොරොත්තු වූයේ නෑ.

# ජේසුගේ කතාව

**කර්තෘ - ගරු මර්සලීන් ජයකොඩි පියතුමා**

**මිළ - රු. 150/=**

**කිතුනු පොතක්**

**ඔබත් සොයාගෙන කියවන්න**

ශිරාන් මෛත්‍රී විසිනි




1989 නත්තල් දා කොළඹ 05, හැව්ලොක් පාරේ අංක 224 නිවහනේ සිට ජේසු කතාව නම් මේ පොත ගැන සඟ සැපත් ගරු මර්සලින් ජයකොඩි පියතුමා මෙසේ පවසා ඇත.

“ව්‍යාකරණය අබිබවා ගොස් ගෙදර කතා කරන බසින් මේ පොඩි පොත ලීවේ ජේසුතුමා කවරකුදැයි බාලයිනටත්, කාටත්, කටෙන් බහෙන් යම් යම් දේ එතුමා ගැන අසා තිබුණ මුත් පැහැදිලි දැනුමක් නොතිබුණු වැඩිහිටියන්ටත් එතුමා හඳුනා ගැනීම සඳහා ය.

***දූ දරුවන්ට පමණක් නොව - ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ගැන දැන ගැනීමට එතුමා ගැන කියැවීමට කැමැති කොයි කාටත් මේ ග්‍රන්ථය එක්තරා මූලික පදනමක් සපයයි. කිතුනු සංනිවේදන පාතික අධ්‍යක්‍ෂ ගරු බෙනඩික්ට් ජෝශප් පියතුමා ජේසු කතාව ගැන හැඳින්වීමක් කරයි.***

මෙහි දී කිවයුත්තකි. දිනක් මාගේ හිතවත් ප්‍රකාශක සෝමසිරි කස්තුරිආරච්චි මහතා මෙවැනි පොතක් ලිවීම හොඳ දෙයක් නොවේ දැයි මගෙන් ප්‍රශ්න කළ පසු එය ඉතා යහපත් අදහසක් යැයි මට වැටහී ගිය හෙයින් මේ පොත ලීවෙමි.”

ඉන් වසර විසි තුනකට පසු මේ පොත මුද්‍රණයෙන් දැන් නිකුත් වී ඇත. ජයකොඩි පියතුමාගේ ළගන්නා සුළු - සුමට සරල බස් වහර මේ ග්‍රන්ථය පුරා දැක ගත හැකියි.

එතුමා ග්‍රන්ථය අරඹන්නේ මේ අන්දමිනි.

පොඩි පුත, පොඩි දූ,
දැන් මා ඔබට කියන්න යන්නේ ජේසු තුමා ගේ කතාවයි. ඔන්න එකමත් එක රටෙක පුතකු ඉපදුණා, පුංචි පැලෙක. ඒ රටේ සිරිත හැටියට මේ දුප්පත් පැල් වැසියන්ගේ එළුවන්, බැටළුවන්, ගොනුන්, දෙනුන් පවා ලැග්ගේ මේ පැල්වලමයි. ඒ හොරුන් ගෙන් වනසතුන් ගෙන් බේරෙන්නටයි.

මේ බබා ඉපැදුණු පැලෙත් ගොනුන් - දෙනුන් හිටියා. මා මේ කියන රටේ නම පලෙස්තීනයයි; ගමට කියන්නේ බෙත්ලෙහෙම කියායි. දරුවා ගේ මව මරියා. රජ පවුලෙකින් පැවැතුණත් මේ මව බොහෝ ම දිළිඳුයි.

මේ දෙදෙනා විසුවේ ඉහළ පලෙස්තීනයේ, ගලීලය කියන පළාතේ නාසරෙත් නම් ගමෙයි. ඒ කඳු. ලඳු තිබුණු පුංචි ගමක්. වැඩිදෙනා ජීවත් වුණේ ගොවිතැනින්. වෙනත් අත්කම් ආදිය කළ අයත් හිටියා, ජෝසප් වාගේ......

ගැහැනු ගෙදර දොරේ වැඩ කළා. එළුවන්, බැටළුවන්, ගොනුන්, දෙනුන් බලා ගත්තා. කිරි, කේජු. වෙඬරු, එළවලු, ගෙඩි වර්ග බූරුවන් පිටේ පටවාගෙන වෙළඳපොළට ගියා. ගෙඩිවලට හුඟක් තිබුණේ රට ඉඳියි, රට කජුයි, මිද්‍රිකයි තමා.”

දූ දරුවන්ට පමණක් නොව - ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ගැන දැන ගැනීමට එතුමා ගැන කියැවීමට කැමැති කොයි කාටත් මේ ග්‍රන්ථය එක්තරා මූලික පදනමක් සපයයි. කිතුනු සංනිවේදන ජාතික අධ්‍යක්‍ෂ ගරු බෙනඩික්ට් ජෝශප් පියතුමා ජේසු කතාව ගැන හැඳින්වීමක් කරයි.

සගසැපත් පූජ්‍ය මර්සලීන් ජයකොඩි පියතුමාගේ අත් අකුරු ද දැන හඳුනා ගැනීමට හැකි මේ පොත ලියන්නට එතුමාට යෝජනා කර ඇත්තේ සෝමසිරි කස්තුරි ආරච්චි සූරින්ය. ජේසුකතාව දූ දරු වැඩිහිටි කොයිකාටත් කියවිය හැකි අපූරු පොතකි. මේනිසා දුවේ පුතේ ජේසු කතාව පුංචි ඔබ කොයි කාටත් එක හුස්මට කියවා ගෙන යා හැකි පොතකි.



**එක්මිණි ෆොන්සේකා**
05 ශ්‍රේණිය
ආවේ මරියා බාලිකා මහා විදුහල - මීගමුව

## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**සෝයෙල් සන්දික**
04 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල - මාරවිල



**හේෂාන් ලක්ෂිත**
08 ශ්‍රේණිය
ශු. විනිප්‍රිඩා දහම් පාසල - කහටවිල
( හාල්දඩුවන මීසම)

**කවිඳු සත්සර**
03 ශ්‍රේණිය
සුනිමල දහම් පාසල - වැලිවිට





**සියෝන් දිනිත්‍ර කුරේ**
03 ශ්‍රේණිය
සාන්ත සෙබස්තියන් විදුහල
මොරටුව



**චතුර ජයමාල්**
04 ශ්‍රේණිය
ලූර්දු දේව මාතා
දහම් පාසල
නාත්තන්ඩිය




**ක්‍රිෂෙල් ශමින්දි**
05 ශ්‍රේණිය
ශා.බ්‍රිජට්
කන්‍යාරාමය
කොළඹ 07



**සසිඳු දිමන්ත**
11 ශ්‍රේණිය
සාන්ත පාවුළු දෙව්සත්හල
මාරවිල




**දේව මැණියන් සමග ගැඹුරු සම්බන්ධකමක් ගොඩනගා ගැනීම සඳහා දිනපතා ජපමාලය උච්චාරණය කළ යුතු බව පසුගිය ලිපියෙන් මා ඔබට පැහැදිලි කළෙමි. මගේ දේව කැඳවීම විශ්වාසයේ අත්දැකීමකින් ස්ථිර කර ගත් ආකාරය ගැන ඔබ සමග බෙදා ගන්නෙමි.**



මට පැවිදි සොයුරියක් වීමට ඇඩි ආශාවක් ඇති වුනා.. මීගමුව ප්‍රැන්සිස්කන් මඩමේ දේව කැඳවීම් භාර පැවිදි සොයුරිය හමුවී මගේ කැමැත්ත පැහැදිළි කළෙමි. වසරක පමණ කාලයක් සොයුරියන් හා සමීප සම්බන්ධතා ගොඩ නගා ගත් පසු 1990 ජුලි මාසයේ ආධුනික කණ්ඩායමට බැඳෙන්නට මා තෝරා ගන්නා ලදී. නමුත් මට තව කාලය අවශ්‍ය බව කී විට 1991 ජනවාරි කණ්ඩායමට බැඳෙන්න කියා ප්‍රධාන පැවදි සොයුරිය කීවාය.

මේ වන විට මට ආච්චිව බලාගන්නට වී තිබිණි. මන්ද ඈ අසනීප තත්වයෙන් පසු වු හෙයිනි. එබැවින් මට විශාල අර්බුදයකට මුහුණ දෙන්නට සිදු විය. එනම් මහළු, අසනීප ආච්චිව අමතක කර පැවදි දිවියට ඇතුළු වෙනවාද? පැවදි දිවිය අතහැර ආච්චිව බලාගන්නවාද ? යන්නයි. මේ ඇතුලාන්ත අරගලය සමග සටන් කරමින් සිටියෙමි. පසුව මගේ මෙම ප්‍රශ්නය පැවදි සොයුරියට කී විට ඈ මෙසේ අභියෝග කළාය. ''ඔයාව ජුලි කණ්ඩායමට බඳවා ගන්න ගියාම කල් අවශ්‍ය බව කිව්වා. ජනවාරි කණ්ඩායමට ගත්තාම ආච්චිගේ ප්‍රශ්නය.... නගුලට අත තබා ආපසු හැරි බලන කිසිවකු ස්වර්ග රාජ්‍යයට සුදුසු නොවේ......'' ඔයා එනවා නම් ජනවාරි 30 වැනිදා වනතුරු කල් දෙන්නම්, යාච්ඤා කර තීරණයක් ගන්න.

මගේ ප්‍රශ්නයට විසඳුමක් නොවීය. සිත කලබලවිය. මා කළ යුතු එකම දෙය යාච්ඤා කර විසඳුමක් සොයා ගැනීම යැයි සිතා මගේ ප්‍රශ්නය මෙසේ ජේසුට භාර දුන්නෙමි. මාව දේව සේවයට කැඳවන්නේ ජේසු නම්, උන්වහන්සේ මේ ප්‍රශ්නය විසදවි. මම දේව සේවයට යන්නේ වෙනත් අරමුණු නිසා නම් මගේ ආශාව වෙනස් වේවි යන ස්ථිර විශ්වාසයෙන් යාච්ඤා කළෙමි. ''ජේසුනි මගේ හිතේ ඇති ප්‍රශ්නය , ආශාව ඔබවහන්සේට භාර දෙමි. පැවදි සොයුරිය 30 වැනිදා වන තුරු කල් දුන්නා. මම ජනවාරි 14 වැනිදා වන තුරු පමණක් බලා සිටිනවා.... කියා දිනපතා පාස්කු ඉටිපහන දල්වාගෙන යාච්ඤා කරන්නට පටන් ගත්තෙමි. සිදු වුයේ පුදුමයකි. ආච්චිට හොඳට සනීප වුනා.. පුංචම්මා පැමිණ ආච්චිව එක්කරගෙන ගියා. 1991 ජනවාරි 14 දින මම මඩමට ඇතුළු වුනා.

ආදර දුවේ පුතේ, ඔබගේ ජීවිත කැඳවීම තෝරා ගැනීමට පෙර යාච්ඤා කරන්න. එය පැවදි දිවියට හෝ විවාහ දිවියට විය හැක. ගැඹුරු විශ්වාසයේ අත්දැකීමකින් ජීවිත කැඳවීම හෝ ඔබගේ සහකරුවා හෝ සහකාරිය තෝරා ගන්න. පාසල් කාලයේ අනවශ්‍ය ප්‍රේම සම්බන්ධතා ගොඩ නගා ගෙන නිකරුනේ ජීවිතය නැති කර නොගන්න. සියළු දෙනා සමග නිවැරදි සම්බන්ධතා ගොඩනගා ගෙන අධ්‍යාපනය සඳහා වෙහෙස මහන්සි වෙන්න. එවිට ඔබට යහපත් අනාගතයක් උදවේවි.

**ගරු ශිරෝමා ප්‍රනාන්දු පැවදි සොයුරිය**

මාසික සිතිවිල්ල




සේයා :- ටෙක්ලා කල්දේරා

**මාසික සිතිවිල්ල**

“ජුනි මාසය”

ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

## ප්‍රහේලිකා අංක 31



( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )

**පහළට**

1. මෙම දිවැසිවරයා යාච්ඤා කළ විට වැසි වැස, තුන් අවුරුද්දක් රට පුරා පැවති නියගය කෙළවර විය.

2. සීනයි කන්දේදී දෙවියන් වහන්සේ විසින් මෝසෙස් තුමාට මෙය දෙන ලදී.

3. මෝසෙස් ප්‍රමුඛ ඊශ්‍රායෙල් ජනතාවට ගමන් කරනු සඳහා දෙවියන් වහන්සේ මෙම මුහුද දෙබෑකර එය මැදින් වියලි බිමක් සෑදූ සේක.

4. ''ඔබේ පාද වලින් ...... ගළවා දමන්න. ඔබ සිටින ස්ථානය ශුද්ධ භූමියකි'' දෙවියන් වහන්සේ මෝසෙස්ට වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

6. දෙවියන් වහන්සේ , ඊශ්‍රායෙල් ජනතාව කාන්තාරය මැදින් ගමන් කරන විට ප්‍රාතිහාර්යකින් මේවා ලබා දුන් සේක.

7. ක්‍රිස්තුන් වහන්සේ බොහෝ අවස්ථාවලදී මොවුන් වැහී සිටි අයට සුවය ලබා දුන් සේක.

**හරහට**

1. ශු බයිබලයේ අවසාන පොතේ නම ..........

5. ක්‍රිස්තුන් වහන්සේ ධනවත් ප්‍රධානියාට කථා කොට ''ඔබ... ..සියල්ල විකුනා දිළිඳුන්ට දෙන්න. එවිට ස්වර්ගයෙහි ඔබට සම්පත් ඇති වන්නේය'' වදාළ සේක මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ක්‍රිස්තුන් වහන්සේ මහා.......... කට සුවසෙත උදාකළ බව ශු. මතෙව් තුමා පවසයි. හිස්තැනට සුදුසු වචනය

8. මරිය තුමිය ක්‍රිස්තුන් වහන්සේව ......... දරා සිටියාය. හිස්තැනට සුදුසු වචනය

9. යාච්ඤා කිරීම සඳහා දේව මාලිගයට ගිය අයකැමියා තම .......ට ගසා ගනිමින් ''දෙවියන් වහන්ස පව්කාරවූ මා හට කරුණා කළ මැනව ''යි කීය. හිස්තැනට සුදුසු වචනය.

**(මෙම ප්‍රහේළිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ජුවාම් 19, ශු. ලූක් 18, ශු. මතේව් 4, 1රාජාවලිය 17,18, නික්මයාම 3,18,14,)**

## බිබිල මීසමේ ධර්මදූත ළමෝ පදක්කම් පළඳති.



බිබිල මීසමේ ධර්මදූත ළමා සමාජයේ ළමුන් සඳහා 2012 ලෝක කැඳවීම් දිනයට සමගාමීව පදක්කම් පැළඳවීමේ දිව්‍ය යාගය බදුලු පදවි ධර්මදූත කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ගරු ලක්ෂමන් රණසිංහ පියතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පැවැත්වුණි.

ශු. පවුලේ දේවස්ථානයේ පැවති මෙම දිව්‍ය යාගයේදී ළමෝ 40 ක් පදක්කම් පැළඳුහ. මේ අවස්ථාවට බිබිල මීසම් සේවක ගරු ජුඩ් නිශාන්ත සිල්වා පියතුමන්ද එක්විය. ඉන් අනතුරුව ගරු පියතුමන්, පැවදි සොයුරියන්, සජීවක සජීවිකාවන්, සහ පදක්කම් පැළඳි ළමුන් ළමා ප්‍රදීපය සඳහා ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

**ශිරාන් පෙරේරා**




## එත්තුකාල සා. සිල්වෙස්ටර් දහම් පාසල



එත්තුකාල සා. සිල්වෙස්ටර් දහම් පාසලේ ශිෂ්‍ය නායක නායිකාවන් හට පළමු වරට පදක්කම් පැළඳීමේ උත්සවය පසුගියදා වැල්ලවීදිය හිටපු මීසම් සහයක ගරු ක්‍රිශාන් ජයශාන්ත, බයිබල් ධර්මෝපදේශ හා අධ්‍යාපන අධ්‍යක්ෂ ගරු දිනේෂ් ප්‍රියශාන්ත පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. දිව්‍ය පූජාවෙන් පසු ගරු පියතුමන් සමග දහම් ගුරුවරියන් හා ශිෂ්‍ය නායක නායිකාවන් සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

**ඩී.එම්. වැනිටා මිරාල්**


ඔය අතරේ ලස්සන දිය කිඳුරියක් නැව ළඟම ගල් පරයකට වෙලා.. රාජ් කුමාරයා දිහා ආදරෙන් බලාගෙන සිටියා..! කුමාරය-..ත් එයා දිහා බලාගෙන සිටියා..!
4
රජ් කුමාරයයි කිඳුරා කුමාරියි
කොහොම හරි එළිය වැටෙන කන්ම මේ ගොල්ලො විනෝද වුනා...
ආනන්ද කාලිදේරා රචනා කරයි...
දෙවස්, චිත්‍ර :- ආස්. ඒ. පී. සදුආරච්චිය
ඒත් එළිය වැටීගෙන එනකොට දිය කිඳුරියෝ එක එකෙන් එක වතුරට බැහැල ඈතට පීනගෙන යන්න පටං ගත්තා...
රජ් කුමාරයා අසල සිටි දිය කිඳුරියත් බොහොම කණගාටුවෙන් වගේ කුමාරයට අත වන වනා ඈතට යන්න ගියා...
කුමාරයත් එයා ඈතට යනකන්ම අත වන වනා දුකෙන් වගේ බලාන සිටියා...
රාත්‍රිය ගෙවියනකල්ම සිංදු කිය කිය විනෝදෙන් කාලය ගත කරපු කුමාර වරුන්ට එදා දහවල් කාලයේදී.. ඇහැරුනේම නැහැ.. මුළු දහවල් කාලයම ඒ ගොල්ලන්ට හොඳටම නින්ද ගියා..!

සැකසුම : තිළිණ අලහකෝන්

බයිබලයේ වීර චරිත

# වීර දාවිත්

පස් වන කොටස

